# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 8 දරන මානුෂීය සේවා සඳහා වූ
## රතු පියුම සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 මාර්තු මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. **6.00 යි.** **තැපැල් ගාස්තුව :** රු. **10.00 යි.**

# 2011 අංක 8 දරන මානුෂීය සේවා සඳහා වූ රතු පියුම සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 22 වන දින]

එල්.ඩී.—ඕ. අයි. එන්. සී. 4/2010.

## මානුෂීය සේවා සඳහා වූ රතු පියුම සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත

කවර හෝ ස්වභාවයක ඵලදායී සම්බන්ධීකරණය, සහයෝගයෙන් වැඩ කිරීම සහ ජාලගත වීම හරහා ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් වඩා පුළුල් පෙර සූදානමක් ඇති කිරීම මගින් සහ මෙත්තා, කරුණා, මුදිතා සහ උපේක්ෂාව මත පදනම් වූ මානුෂීය සේවා සඳහා සම්පත් බැංකුවක් වශයෙන් ක්‍රියා කරමින් යම් ස්වාභාවික ආපදා අවස්ථාවන්හි දී සියලු ජනයා දුක්ඛිත තත්ත්වයන්ගෙන් මුදා ගැනීමේ කාර්ය සඳහා බෞද්ධ ප්‍රතිපත්ති අනුව ක්‍රියා කරන "මානුෂීය සේවා සඳහා වූ රතු පියුම සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලැබූ සහ ප්‍රකට වූ සංවිධානයක් මේ දක්වා පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංවිධානනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද එකී පරමාර්ථ සහ කාරණා එම සංවිධානය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංවිධානය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම්කර ඇති හෙයින් සහ එම ඉල්ලීම ප්‍රදානය කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2011 අංක 8 දරන මානුෂීය සේවා සඳහා වූ රතු පියුම සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) මානුෂීය සේවා සඳහා වූ රතු පියුම සංවිධානයේ තත්කාලයේ සාමාජිකයන් වන සියලු තැනැත්තන් සහ සංවිධාන හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මානුෂීය සේවා සඳහා වූ රතු පියුම සංවිධානය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් භාවිත කිරීමට සහ ස්වකීය කැමැත්ත පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය සහ අධිකාරිය ඇතිව එකී සංස්ථාපිත නාමයෙන් නඩු පැවරීම සහ නඩු පවරනු ලැබීමේ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. මානුෂීය සේවා සඳහා වූ රතු පියුම සංවිධානය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. (1) එලදායී සම්බන්ධීකරණය, සහයෝගීතාව සහ සමූහ ක්‍රියාකාරිත්වය තුළින් ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් වඩාත් ප්‍රබල වූ පෙර සූදානම් පසුබිමක් ඇතිකර, ඒ මගින් කවර හෝ ස්වභාවයක ව්‍යසනයක දී එම දුක්ඛිත තත්ත්වයන් පිටුදැකීම හා වළක්වාලීම ද ලෝක ව්‍යාප්ත සහන සේවා සඳහා සම්පත් බැංකුවක් ලෙස ක්‍රියාත්මකවීම ද සංස්ථාවේ පොදු අරමුණු වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ දක්වා ඇති පොදු පරමාර්ථවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි සංවිධානයේ නිශ්චිත පරමාර්ථ හා කාර්යයන් පහත දැක්වෙන පරිදි වන්නේ :—

(අ) මිනිසාට විඳීමට සිදුවන දුක්ඛිත තත්ත්වයන් වළක්වාලීමේ හා පිටු දැකීමේ අභිලාෂයෙන් සෑම ආකාරයක ම මානව සහන සේවා කාර්යයන් කිරීම සඳහා සාමාජික සංවිධාන ධෛර්යමත් කිරීම හා පෙළඹවීම ;

(ආ) සෑම රටක් තුළම මානුෂීය සේවා සඳහා වූ සංගමයක් පිහිටුවීම හා වර්ධනය කිරීම, ඒ සඳහා දිරිදීම සහ ප්‍රවර්ධනය කිරීම සහ එම සංවිධාන තුළ ප්‍රධාන සංවිධානයේ ප්‍රතිපත්ති ප්‍රතිෂ්ඨාපනය කිරීම ;

(ඇ) ජාතික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර මට්ටමින් පූර්ව ව්‍යසන පෙර සූදානම් ව්‍යාපෘති නිර්මාණය කිරීම හා ඊට සහාය වීම ;

(ඈ) සහනය, පුනරුත්ථාපනය, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ද, පෞරුෂ සංවර්ධනය සඳහා ද අවශ්‍ය සම්පත් සම්පාදනය කිරීම සහ යෙදවීම ;

(ඉ) වෙනස්ව සැලකීමෙන් තොරව ව්‍යසනවලට ගොදුරු වූවන්ට හැකි උපරිම අයුරින් සහන සේවා සැපයීම;

(ඊ) සංස්ථාවේ පොදු පරමාර්ථවලට අනුකූලව ද ජාතික සංගම් හා සාමාජික සංගම් සමග සහයෝගීතාවෙන් ද යුතුව ජාත්‍යන්තර සහන සේවා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා මෙහෙයවීම;

(උ) ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් කාර්යක්ෂම සංවිධාන ව්‍යුහයන් සහ තොරතුරු බෙදාහැරීමේ යටිතල පහසුකම් ඇති කිරීම;

(උෟ) ජාත්‍යන්තර, ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ව්‍යසන කළමනාකරණ කුසලතා, ප්‍රථමාධාර, ජීවිත බේරාගැනීමේ කුසලතා, කම්පන උපදේශනය, ළමා ආරක්ෂණ කළමනාකරණය සහ කෙටිකාලීන හා දීර්ඝ කාලීන පුනරුත්ථාපන කටයුතු සඳහා පුහුණු කිරීමේ ව්‍යාපෘති නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම හා අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම ;

(එ) ජාතික සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන සමග සම්බන්ධිත දත්ත සමුදාය හා වෙබ් අඩවියක් පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඒ) රතු කුරුස සහ රෙඩ් ක්‍රෙසන්ට් ව්‍යාපාර වැනි සමාන ජාත්‍යන්තර සංවිධාන සමග සබඳතා වර්ධනය කිරීම ;

(ඔ) සහන සේවා සඳහා පදනම වශයෙන් විශේෂයෙන්ම තරුණ හා ළමාවියේ අයට වඩාත් අදාළ වන පරිදි වැඩි අවබෝධයක් හා පරිචයක් ප්‍රවර්ධනය කිරීම ;

(ඕ) සාමාජික සංවිධාන අතර මිත්‍රත්වය, අන්තර් ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරමින් එකී සංගම් අතර සම්බන්ධීකරණය ඇති කිරීම;

(ක) විවිධත්වයේ ද්වීතියික සාධකවලට ඉහළින් මිනිස්කමේ ඒකත්වය නැගීසිටීමේ සත්‍යතාවය පොදු ජනතාවට අවබෝධ කරදීම ;

(ග) උචිත සෑම අවස්ථාවක දී ම මානව හිතවාදී නීති සම්පාදනය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා ප්‍රචලිත කිරීම සඳහා රජයට කරුණු ඉදිරිපත් කිරීම ; සහ

(ජ) විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික හෝ ජාත්‍යන්තර හෝ සම්මන්ත්‍රණවල දී සාමාජික සංගම්වල නිල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(3) (1) සහ (2) උපවගන්තිවල නිශ්චිතව දැක්වෙන පරිදි මේ පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, කුලය, ආගම, භාෂාව, දේශපාලන මතය පිළිබඳ වෙනස්කම්වලින් තොරව එවැනි ක්‍රියාත්මක කිරීම් සිදු කරන බවට සංස්ථාව සහතික විය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම විධායක කමිටුවක් මගින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන විධායක කමිටුවේ සාමාජිකයන් විධායක කමිටුවේ පළමු සාමාජිකයන් විය යුතු අතර, ඔවුන් 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කමිටුවක් තෝරා පත් කර ගන්නා තුරු ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ බලතල හා කාර්යය.

**5.** (1) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ උපස්තම්භක වන්නා වූ ද ආනුෂංගික වන්නා වූ ද සියලුම දේ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය.

(2) (1) වන වගන්තියේ පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව සංස්ථාවට පහත දැක්වෙන බලතල සහ කර්තව්‍ය ඇත්තේ ය :—

(අ) දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ අන් ආකාරයකින් තෑගි, ප්‍රදානයන්, පරිත්‍යාගයන්, ආධාර සහ සම්මාදම් භාර ගැනීම හෝ එකතු කිරීම ;

(ආ) ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පතු බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම, විවෘත කිරීම, වැසීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඇ) මිල දී ගැනීමෙන්, ප්‍රදානයන් මගින්, තෑගි මගින්, තෙස්තමේන්තු නීයාදනයන් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන නිශ්චල හෝ චංචල දේපළ අත්කර ගැනීම සහ දැරීම ;

(ඈ) සංස්ථාවට අයිති හෝ සංස්ථාව විසින් දරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් එම දේපළ සම්බන්ධ යම් භාරයකට යටත්ව, විකිණීම, බදු දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම;

(ඉ) සංස්ථාව වෙත සතු වී ඇති හෝ සංස්ථාවට අයිති අරමුදල් ප්‍රමාණවත් සුරැකුම්වල අවශ්‍ය පරිදි ආයෝජනය කිරීම;

(ඊ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් ඉදිකිරීම හෝ ඉදිකිරීමට සැලැස්වීම සහ සංස්ථාවේ මූලස්ථානයෙහි ලේකම් කාර්යාලයක් පිහිටුවීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු නිසි පරිදි ඉටුකිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

**6.** (1) සංස්ථාව විසින් කලින් කලට, මහා සභා රැස්වීමක දී පැමිණ සිට ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ, බලතල සහ කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා රීති සම්පාදනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය. සංස්ථාවේ රීති.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, එම රීති මගින් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් ඕනෑම එකක් හෝ සම්බන්ධයෙන් විධිවිධාන සලසාලිය හැකි වේ:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් නෙරපීම;

(ආ) කාර්ය මණ්ඩලය, සේවකයන් සහ වෙනත් සේවා නියුක්තිකයන් බඳවා ගැනීම, පත් කිරීම සහ විනය පාලනය සහ අනුයෝජිතයන් හා නියෝජිතයන් පත් කිරීම; සහ

(ඇ) සංවිධානයේ පරමාර්ථ, බලතල සහ කර්තව්‍ය ඉෂ්ට කර ගැනීම හෝ මුදුන්පමුණුවා ගැනීම පිණිස, උපස්තම්භක වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ හෝ වෙනත් යම් කරුණු.

(3) එවැනි ම රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් එම රීති සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකි වේ.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ එය වෙනුවෙන් ත්‍යාග, පැවරුම්, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටුකිරීමේ දි සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය මුදල්.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ පැවති සංවිධානයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, සංවිධානයට අයවිය යුතු සියලු ණය සහ ඊට ගෙවිය යුතු ග්‍රාහක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවේ ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ එහි සියලු ගනුදෙනු සඳහා නිසි පරිදි ගිණුම් තබා ගැනීමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් අවම වශයෙන් සෑම වර්ෂයකම එක්වතාවක්වත් සුදුසුකම් ලත් විගණකවරුන් එක් අයෙකු හෝ ඊට වැඩි ප්‍රමාණයක් විසින් පරීක්ෂා කිරීම සහ විගණනය කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරුවන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන්

වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

10. (1) ධර්ම චක්‍රය වටා ලියන ලද මෙත්තා, කරුණා, මුදිතා, උපේක්‍ෂා යන වචන ඇතුළත් වූ ධර්ම චක්‍රය මත පිහිට වූ රතු පියුම සංස්ථාවේ ලාංඡනය වන්නේ ය.

සංස්ථාවේ ලාංඡනය සහ මුද්‍රාව.

(2) විධායක සභාවේ අවසරය ඇතුව මිස සහ විධායක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට සංවිධානයේ මුද්‍රාව නොතැබිය යුතු ය. එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාධකයක් වශයෙන් එකී සාධන පත්‍රයේ තම නම අත්සන් කළයුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

11. සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා සංස්ථාවේ කිසිම සාමාජිකයකු කිසිම සම්මාදමක් කිරීමට යටත් නොවිය යුතු ය.

සංස්ථාවේ සාමාජිකයන්ගේ බැඳීම සීමා කිරීම.

12. සංස්ථාව විසුරුවා හරින ලද විටක, එහි සියලුම ණය සහ බැරකම් සමථයකට පත් කිරීමෙන් පසුව, මුදල් ද ඇතුළුව යම් දේපළක් ඉතිරි වුවහොත්, එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරන්නා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ණය ගෙවීමෙන් පසු ඉතිරිවන සංස්ථාවේ දේපළ බැහැර කිරීම.

13. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් හෝ නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.